විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2015 (සංශෝධන)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2015
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2015.10. 9.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම

මා විසින් නිකුත් කල 2015.02.10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2015 විධිවිධාන සඳහා වැඩිමනක් වශයෙනි.

01. ඉහත 01/2015 චක්‍රලේඛයෙහි (01) හා (02) යටතේ දායක මුදල් ආපසු ගෙවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

**1.1** විශ්‍රාම වැටුපක් සහිතව රාජ්‍ය සේවය අවසන් කරනු ලබන දායකයින් සඳහා වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම, මාසික විශ්‍රාම වැටුප් ප්‍රදානය, පාරිතෝෂිකය ලබාගැනීමේ අයදුම්පත (PD 03) ඉදිරිපත් කිරීමේදී සිදුකළ යුතුය.

**1.2** ඒ සඳහා **PD 03** අයදුම්පතට සංශෝධන ලෙස ඇතුළත් කරන ලද **"IV කොටස"** අදාළ ආයතනය මඟින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පත් සඳහා ගෙවීම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු විසින් සෘජුවම අදාළ නිලධාරීන් වෙත ගෙවීම් සිදු කරනු ලබයි. මෙම ක්‍රමය **2015නොවැම්බර් 01** වන දින සිට ක්‍රියාත්මකය.

**1.3** දායකයා විශ්‍රාම යාමට පෙර දායක මුදල් ආපසු ගෙවීම සඳහා අයදුම් පත්‍රය ඉදිරිපත් වන බැවින් විශ්‍රාම යන දින දක්වාම නියමිත පරිදි වැන්දඹු අනත්දරු දායක මුදල් අය වන බවට සහතික කර ගත යුතුය. ඒ අනුව විශ්‍රාම යන දිනය දක්වාම දායක මුදල ගණනය කර ඉදිරිපත් කල යුතුය.

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලබන නිලධාරීන්/ නිලධාරිනියන්ට සේවා අවසාන ප්‍රතිලාභ කඩිනමින් ලබාගැනීමට අවශ්‍ය නිසි කටයුතු සැලසීම පිළිබඳව කෘතඥ වෙමි.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: 1.ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන, පළාත් සභා පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනයපිළිබඳ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය
5. විගණකාධිපති - අ.ක.ස.